සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**60 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2013**

| | | |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | I, II | පැය තුනයි |
| வணிகக் கல்வியும் கணக்கீடும் | I, II | மூன்று மணித்தியாலம் |
| **Business and Accounting Studies** | **I, II** | *Three hours* |

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

---

- පහත සඳහන් ප්‍රකාශය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
"ව්‍යාපාර විසින් මිනිස් අවශ්‍යතා තුළින් මතුවන වුවමනා තෘප්තිමත් කිරීමට විවිධ **නිෂ්පාදිත** යොදා ගනියි. මෙම නිෂ්පාදිත, නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා බෙදාහැරීමේ දී විවිධ අතරමැදියන් සම්බන්ධ වේ."

1. පහත සඳහන් දෑ අතුරෙන් මිනිස් අවශ්‍යතාවක් වන්නේ,
(1) පැන්සල් ය. (2) ඇඳුම් ය. (3) පාවහන් ය. (4) බෙහෙත් ය.

2. ළී බඩු නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් අයත් වන්නේ,
(1) ප්‍රාථමික නිෂ්පාදනයට ය. (2) කෘෂිකාර්මික නිෂ්පාදනයට ය.
(3) ද්විතීයික නිෂ්පාදනයට ය. (4) තෘතීයික නිෂ්පාදනයට ය.

3. නිෂ්පාදිත මූලික වශයෙන් වර්ග කරනුයේ,
(1) ප්‍රාථමික හා ද්විතීයික ලෙස ය. (2) කෘෂිකාර්මික හා කාර්මික ලෙස ය.
(3) සෘජු හා වක්‍ර ලෙස ය. (4) භාණ්ඩ හා සේවා ලෙස ය.

4. බෙදාහැරීමේ ක්‍රියාවලියේ අතරමැදියෙක් **නොවන්නේ**,
(1) පාරිභෝගිකයා ය. (2) තොග වෙළෙන්දා ය. (3) සිල්ලර වෙළෙන්දා ය. (4) නියෝජිතයා ය.

5. "බැංකු විසින් තැන්පතු සඳහා ලබා දෙන පොළී අනුපාතය මත රටක ඉතිරි කිරීම් තීරණය වේ."
මෙම ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසර සාධකය කුමක් ද?
(1) සමාජ හා සංස්කෘතික පරිසරය ය. (2) ප්‍රජා පරිසරය ය.
(3) ආර්ථික පරිසරය ය. (4) දේශපාලන පරිසරය ය.

6. පහත දැක්වෙන්නේ ව්‍යාපාර විකාශනයේ අදියරයන් ය.

| | |
|---|---|
| A - මුදල් භාවිතය | B - භාණ්ඩ හුවමාරුව |
| C - තොරතුරු තාක්ෂණය | D - කාර්මික විප්ලවය |

ව්‍යාපාර විකාශනයේ අදියර අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) A, B, C, D (2) B, A, C, D (3) B, D, A, C (4) B, A, D, C

7. කපිල කුමාරසිංහ විසින් "කුමාර ස්ටෝර්ස්" නමින් වෙළෙඳ සැලක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙය හවුල් ව්‍යාපාරයකි.
(2) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(4) මෙම ව්‍යාපාරයේ වගකීම සීමිත වේ.


8. සමන් විශේෂිත වර්ගයක පාවහන් නිෂ්පාදනය කිරීමට අදහස් කරයි. මේ සඳහා ඔහු ප්‍රථමයෙන් ම කළ යුතු වන්නේ,
(1) ව්‍යාපාරික ස්ථානයක් මිල දී ගැනීම ය. (2) බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීම ය.
(3) සේවකයින් බඳවාගෙන පුහුණු කිරීම ය. (4) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීම ය.

9. සෘජු ද්‍රව්‍ය පිරිවැය + [ ① ] + [ ② ] + නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය = මුළු නිෂ්පාදන පිරිවැය
ඉහත සමීකරණයේ ① හා ② ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වක්‍ර ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් වියදම් (2) සෘජු ශ්‍රම පිරිවැය, සෘජු වෙනත් වියදම්
(3) වක්‍ර ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් වියදම් (4) සෘජු ශ්‍රම පිරිවැය, වක්‍ර වෙනත් වියදම්

10. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේදී, ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන ආරම්භක ප්‍රාග්ධන ඇස්තමේන්තුව ඇතුළත් කරනුයේ,
(1) අලෙවි සැලැස්මෙහි ය. (2) මෙහෙයුම් සැලැස්මෙහි ය.
(3) මානව සම්පත් සැලැස්මෙහි ය. (4) මූල්‍ය සැලැස්මෙහි ය.

11. පහත දැක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ දැකිය හැකි බැංකු කිහිපයකි.
A - ශ්‍රී ලංකා මහ බැංකුව B - ජාතික ඉතිරි කිරීමේ බැංකුව
C - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව D - හැටන් නැෂනල් බැංකුව
ඉහත බැංකු අතුරෙන් වාණිජ බැංකුවක් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

- පහත දැක්වෙන්නේ නිවැරදි ව ලියන ලද චෙක්පතක ඡායා පිටපතකි. එය ඇසුරෙන් අංක **12** හා **13** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




12. මෙම චෙක්පත සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම චෙක්පත සාමාන්‍ය රේඛනය සහිත චෙක්පතකි.
(2) මෙම චෙක්පත විශේෂ රේඛනය සහිත චෙක්පතකි.
(3) මෙම චෙක්පතේ අංකය 0002323980 වේ.
(4) මෙම චෙක්පතේ සඳහන් මුදල මහජන බැංකු කවුන්ටරයකින් ලබා ගත හැකි ය.

13. මෙහි ජංගම ගිණුම්හිමියා වන්නේ,
(1) නිමල් පෙරේරා ය. (2) සමන් සිල්වා ය.
(3) ලංකා බැංකුව පස්වෙනි නගර ශාඛාව ය. (4) මහජන බැංකුව මහරගම ශාඛාව ය.

14. රක්ෂණය සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෝටර් රථය සඳහා ගත් රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි ය.
(2) ස්වාමිපුරුෂයෙකුට තම භාර්යාවගේ ජීවිතය රක්ෂණය කළ නොහැකි ය.
(3) හානිපූරණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ නොවේ.
(4) රක්ෂණයේ දී අවදානම නිශ්චිත වන අතර ආරක්ෂණයේ දී අවදානම නිශ්චිත නොවේ.

15. පහත දැක්වෙන්නේ සන්නිවේදන මාධ්‍යය හා සන්නිවේදන ක්‍රම කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍යය | සන්නිවේදන ක්‍රම |
|---|---|
| 1. වාචික | A - අන්තර්ජාලය |
| 2. ලිඛිත | B - සාකච්ඡාව |
| 3. විද්‍යුත් | C - ලිපිය |

ඉහත සන්නිවේදන මාධ්‍යයන් සඳහා අදාළ සන්නිවේදන ක්‍රම නිවැරදි අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,
(1) A, B, C ය. (2) B, A, C ය. (3) B, C, A ය. (4) C, B, A ය.

16. මාර්ගය, මාධ්‍යය, බලය හා පර්යන්තය යන ප්‍රවාහනයේ මූලිකාංග සඳහා නිදසුන බැගින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මහා මාර්ග, දුම්රිය, ඛනිජතෙල්, බස් නැවතුම් පොළ
(2) ඛනිජ තෙල්, ගල් අඟුරු, වරාය, ජල මාර්ග
(3) ගුවන් මාර්ග, ගුවන් යානා, වරාය, ජල මාර්ග
(4) විදුලිය, දුම්රිය, ගෑස්, දුම්රිය නැවතුම් පොළ

17. පොලී ආදායමක් **නොලැබෙන** බැංකු තැන්පතු ගිණුම වන්නේ,
(1) ඉතිරි කිරීමේ ගිණුම ය. (2) ජංගම ගිණුම ය.
(3) ස්ථාවර තැන්පතු ගිණුම ය. (4) අනේවාසික විදේශ මුදල් ගිණුම ය.

18. හවුල් ව්‍යාපාරයකට මූල්‍ය සම්පාදනය කර ගත හැකි මාර්ගයක් වනුයේ,
(1) සාමාන්‍ය කොටස් ය. (2) වරණීය කොටස් ය. (3) ණයකර ය. (4) බැංකු ණය ය.

19. ආයෝජකයෙකු කොටසක් රු. 30 බැගින් සාමාන්‍ය කොටස් 1 000 ක් මිලට ගෙන, එම කොටසක් රු. 32 බැගින් විකුණා රු. 2 000 ක ප්‍රතිලාභයක් ලැබිය. මෙම ප්‍රතිලාභය හඳුන්වන්නේ,
(1) ප්‍රාග්ධන ලාභ ලෙස ය. (2) ලාභාංශ ලෙස ය.
(3) පොළී ආදායම ලෙස ය. (4) විකුණුම් මිල ලෙස ය.

[ අනෙක් පිටුව බලන්න.

20. කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ,
(1) ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි.
(2) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසිනි.
(3) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසිනි.
(4) කොළඹ කොටස් තැරැව්කරුවන්ගේ සංගමය විසිනි.

● පහත තොරතුරු ඇසුරෙන් **21** හා **22** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2013.03.31 දිනට රෝහණගේ ව්‍යාපාරයේ පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| | |
|---|---|
| මෝටර් රථ | රු. 150 000 |
| බැංකු ණය | රු. 50 000 |
| ණයගැතියෝ | රු. 20 000 |
| ණයහිමියෝ | රු. 25 000 |
| මුදල් | රු. 12 000 |

21. මෙම ව්‍යාපාරයේ 2013.03.31 දිනට ප්‍රාග්ධනය වනුයේ,
(1) රු. 107 000 (2) රු. 132 000 (3) රු. 157 000 (4) රු. 207 000

22. මෙම ව්‍යාපාරයේ 2013.03.31 දිනට ජංගම වත්කම්වල වටිනාකම වනුයේ,
(1) රු. 32 000 (2) රු. 37 000 (3) රු. 75 000 (4) රු. 182 000

23. පහත ගිණුම් වර්ග අතුරෙන් ගැතිලි ගිණුම අයත් වන්නේ,
(1) වත්කම් ගිණුම්වලට ය. (2) වියදම් ගිණුම්වලට ය.
(3) හිමිකම් ගිණුම්වලට ය. (4) ආදායම් ගිණුම්වලට ය.

24. ව්‍යාපාරයක මූලික පොත්වල සටහන් කර තිබූ ගනුදෙනු දෙකක් පහත දැක්වේ.
● අසංක රු. 1 500 ක භාණ්ඩ ආපසු එවීම.
● ව්‍යාපාරයේ කඩ කුලිය රු. 2 000 ක් මුදලින් ගෙවීම.
ඉහත ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමේ දී භාවිත කළ මූලාශ්‍ර ලේඛන දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ලදුපත හා ගෙවීම් වවුචරය (2) හරපත හා ගෙවීම් වවුචරය
(3) බැරපත හා ගෙවීම් වවුචරය (4) හරපත හා බැරපත

25. පහත සඳහන් වන්නේ මුදල් පොතේ බැංකු ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස්වීමට බලපෑ හේතු ය.
A - මුදල් පොතේ සටහන් නොවූ බැංකුව කළ ස්ථාවර නියෝග ගෙවීම් රු. 500 යි.
B - මුදල් පොතේ සටහන් නොවූ බැංකුවට ලැබී ඇති ආයෝජන ආදායම් රු. 900 යි.
C - තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 5 000 යි.
මේවායින් මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීමේ දී අදාළ කර ගනුයේ,
(1) A පමණි. (2) C පමණි.
(3) A හා B පමණි. (4) A, B හා C යන සියල්ලම ය.

26. කමල්ගේ ව්‍යාපාරයේ 2013 සැප්තැම්බර් 01 දිනට සුළු මුදල් භාරකරු සතු ව තිබූ මුදල රු. 110 කි. එදින ප්‍රධාන මුදල් භාරකරු විසින් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු. 1 390 ක් ලබා දෙන ලදී. ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමයේ වටිනාකම වන්නේ,
(1) රු. 110 යි. (2) රු. 1 390 යි. (3) රු. 1 500 යි. (4) රු. 1 610 යි.

27. ව්‍යාපාරයක ගැනුම් ජ'නලයක ඇතුළත් කරනුයේ,
(1) සියලුම ණයට ගැනුම් ය. (2) අත්පිට මුදලට ගැනුම් ය.
(3) ජංගම නොවන වත්කම් ණයට ගැනුම් ය. (4) විකිණීම සඳහා බඩු තොග ණයට ගැනුම් ය.

28. ව්‍යාපාරයට මුදල් ලැබීමක දී භාවිත කෙරෙන ලදුපත,
(1) මූලික පොතකි. (2) ජ'නලයකි. (3) මූලාශ්‍ර ලේඛනයකි. (4) ලෙජර් ගිණුමකි.

29. පහත සඳහන් වන්නේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවකි.
2013.02.01 දින රු. 25 000 ක් වටිනා ලී බඩු තුරේ සමාගමෙන් ණයට ගැනීම.
මෙම ගනුදෙනුව සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම ගනුදෙනුවට අදාළ වටිනාකම හර කළ යුත්තේ ගැනුම් ගිණුමට ය.
(2) මෙම ගනුදෙනුව වාර්තා කළ යුතු මූලික සටහන් පොත පොදු ජ'නලය යි.
(3) මෙම ගනුදෙනුවට අදාළ වටිනාකම හර කළ යුත්තේ ලී බඩු ගිණුමට ය.
(4) මෙම ගනුදෙනුවට අදාළ වටිනාකම බැර කළ යුත්තේ තුරේ සමාගමේ ගිණුමට ය.

30. ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත X තීරුවේ ද, ව්‍යාපාරය විසින් පවත්වාගෙන යනු ලබන මූලික පොත් කිහිපයක් පහත Y තීරුවේ ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. රු. 1 000 ක බඩු තොග ණයට ගැනීම. | A - ආපසු යැවුම් ජ'නලය |
| 2. රුවන්ට ආපසු යැවුම් රු. 1 200 | B - පොදු ජ'නලය |
| 3. පාලිතට ණයට විකුණුම් රු. 1 500 | C - ගැනුම් ජ'නලය |
| 4. බොල් ණය කපා හැරීම රු. 800 | D - විකුණුම් ජ'නලය |

X තීරුවේ සඳහන් ගනුදෙනු Y තීරුවේ සඳහන් මූලික පොත් සමඟ නිවැරදි ව අනුපිළිවෙළට ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) B, C, D, A (2) C, B, D, A (3) C, A, B, D (4) C, A, D, B

- පහත දැක්වෙන්නේ ගිණුම් තැබීමේ දී සිදු වී ඇති දෝෂයකි. එය ඇසුරෙන් අංක 31 හා 32 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  ආපසු එවුම් ජර්නලයේ එකතුව රු. 2 000 ක් වැඩිපුර එකතු වීම.

31. මෙම ගිණුම්කරණ දෝෂය නිසා,
    (1) ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 2 000 කින් අඩු වේ.
    (2) ශේෂ පිරික්සුමේ හර පැත්ත රු. 2 000 කින් වැඩි වේ.
    (3) ශේෂ පිරික්සුමේ බැර පැත්ත රු. 2 000 කින් වැඩි වේ.
    (4) ශේෂ පිරික්සුමේ හර බැර තීරුවල එකතුවට බලපෑමක් ඇති නොවේ.

32. මෙම වරද නිවැරදි කිරීමේ ජර්නල් සටහන වන්නේ,
    (1) ආපසු එවුම් ගිණුම හර රු. 2 000
        ණයගැති ගිණුම බැර රු. 2 000
    (2) ණයගැති ගිණුම හර රු. 2 000
        ආපසු එවුම් ගිණුම බැර රු. 2 000
    (3) ආපසු එවුම් ගිණුම හර රු. 2 000
        අවිනිශ්චිත ගිණුම බැර රු. 2 000
    (4) අවිනිශ්චිත ගිණුම හර රු. 2 000
        ආපසු එවුම් ගිණුම බැර රු. 2 000

33. ව්‍යාපාරයක් රු. 600 000 කට යන්ත්‍රයක් මිල දී ගෙන ඇත. එහි ඵලදායී ජීවිත කාලය අවුරුදු 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එම කාලය අවසානයේ සුන්බුන් අගය රු. 50 000 කි. මෙම යන්ත්‍රයේ වාර්ෂික ක්ෂය ප්‍රමාණය වනුයේ,
    (1) රු. 50 000 කි. (2) රු. 55 000 කි. (3) රු. 60 000 කි. (4) රු. 550 000 කි.

34. වෙළඳ ව්‍යාපාරයක් එහි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ වියදම රු. 150 000 මුදලින් ගෙවා ඇත. මෙය එම ව්‍යාපාරයේ,
    (1) ආයභාර වියදමකි. (2) ප්‍රාග්ධන වියදමකි. (3) උපචිත වියදමකි. (4) මූල්‍ය වියදමකි.

35. එක්තරා ක්‍රීඩා සමාජයක 2012 වර්ෂයේ සිටි සාමාජික සංඛ්‍යාව 100 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 60 කි. සාමාජිකයින් 10 දෙනෙකු 2012 වර්ෂය සඳහා සාමාජික මුදල් ගෙවා නැත. 2012 වර්ෂයට අදාළ මුළු සාමාජික මුදල් ආදායම වන්නේ,
    (1) රු. 600 කි. (2) රු. 5 400 කි. (3) රු. 6 000 කි. (4) රු. 6 600 කි.

36. සුහද ක්‍රීඩා සමාජයේ 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් හා වියදම් ගිණුමේ හර පැත්තේ එකතුව රු. 26 000 ක් වූ අතර, බැර පැත්තේ එකතුව රු. 23 000 ක් විය. මෙම ක්‍රීඩා සමාජය 2012 වර්ෂය සඳහා,
    (1) රු. 23 000 ක අතිරික්තයක් ලබා ඇත. (2) රු. 26 000 ක ඌනතාවක් ලබා ඇත.
    (3) රු. 3 000 ක අතිරික්තයක් ලබා ඇත. (4) රු. 3 000 ක ඌනතාවක් ලබා ඇත.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 37 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  තාරකගේ වෙළඳ ව්‍යාපාරයේ 2012.12.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | (රු.) |
|---|---|
| ආරම්භක තොගය (2012.01.01 දිනට) | 30 000 |
| ගැනුම් | 60 000 |
| විකුණුම් | 105 000 |
| 12% බැංකු ණය | 50 000 |
| ආපසු එවුම් | 5 000 |
| ආපසු යැවුම් | 2 000 |
| ඉඩම් (පිරිවැයට) | 130 000 |
| ලද වට්ටම් | 2 100 |
| ආයෝජන ආදායම් | 3 500 |
| විදුලි ගාස්තු | 8 000 |
| ගොඩනැගිලි කුලී | 12 000 |
| ප්‍රචාරණය | 3 600 |

අමතර තොරතුරු :
1. 2012.12.31 දිනට තොගයේ පිරිවැය රු. 16 000 කි.
2. 2012.12.31 දිනට උපචිත විදුලි ගාස්තුව රු. 1 200 කි.

37. මෙම ව්‍යාපාරයේ 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,
    (1) රු. 12 000 කි. (2) රු. 26 000 කි. (3) රු. 28 000 කි. (4) රු. 31 000 කි.

38. 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභාලාභ ගිණුමේ දැක්වෙන විදුලි ගාස්තුව වනුයේ,
    (1) රු. 1 200 කි. (2) රු. 6 800 කි. (3) රු. 8 000 කි. (4) රු. 9 200 කි.

39. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි වෙළෙඳ ආදායමක් හා වෙළෙඳ නොවන ආදායමක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
    (1) ආයෝජන ආදායම් හා ලද වට්ටම් (2) ලද වට්ටම් හා විකුණුම් ආදායම
    (3) ලද වට්ටම් හා ආයෝජන ආදායම් (4) ආයෝජන ආදායම් හා විකුණුම් ආදායම

40. මෙම ව්‍යාපාරයේ 2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වනුයේ,
    (1) රු. 2 800 කි. (2) රු. 4 000 කි. (3) රු. 8 800 කි. (4) රු. 10 800 කි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**60 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත්:** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, II කොටසෙන් ප්‍රශ්න **දෙකක් ද**, බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

1. ● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **(i)** සිට **(v)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පියදාස කාලයක් තිස්සේ කිරි ගවයින් ඇති කරන ගැමියෙකි. ඔහු තම කිරි ගවයින්ගෙන් පිරිසිදු ව දොවා ගන්නා නැවුම් කිරි අවට නිවෙස්වලට සාධාරණ මිලකට ඔහු විසින් ම බෙදාහැරීම සිදු කරයි. ඔහු තම සහයට සේවකයකු බඳවා ගැනීමට අදහස් කරන අතර, තම ව්‍යාපාරය 'දාස නැවුම් කිරි' නමින් ලියාපදිංචි කිරීමට ද අපේක්ෂා කරයි.

(i) නැවුම් කිරි කුමන මිනිස් අවශ්‍යතාව සපුරාලන්නේ ද?

(ii) පියදාසගේ ව්‍යාපාරයේ බෙදාහැරීමේ ක්‍රියාවලිය දක්වන්න.

(iii) පියදාස සිය නැවුම් කිරි ඔහු විසින් ම බෙදාහැරීමේ නිරත වන බැවින් ඔහු සෘජු නිෂ්පාදනයේ යෙදෙන්නෙකු බව ඔබගේ මිතුරා පවසයි.

(අ) මිතුරාගේ ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද නැද්ද යන්න දක්වන්න.

(ආ) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(iv) (අ) පියදාසගේ අපේක්ෂාව අනුව මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම සඳහා සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) එම ව්‍යාපාර සංවිධානය ලියාපදිංචි කළ යුත්තේ කුමන නීතියක් යටතේ ද?

(v) පහත දැක්වෙන්නේ පුවත්පතකින් උපුටාගත් සිරස් තලයකි.

"රජය විසින් වේ ප්‍රෝටීන් (Whey protein) අඩංගු කිරිපිටි ආනයනය තහනම් කරයි."

මෙම සිදුවීම පියදාසගේ ව්‍යාපාරයට කෙසේ බලපාන්නේ ද යන්න දක්වන්න.

● පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක **(vi)** සිට **(x)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2013.01.01 දින අමාලි, කාන්තා අත්බෑග් මිල දී ගෙන විකිණීම සඳහා ව්‍යාපාරයක් තමා සතු ව තිබූ රු. 50 000 ක මුදල ද, රු. 80 000 ක් වටිනා ඇය සතු මෝටර් රථය ද සහ රු. 20 000 ක බැංකු ණය මුදලක් ද යොදා ආරම්භ කරන ලදී.

2013 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

* 2013.01.03 ණයට ගැනුම් රු. 30 000
* 2013.01.07 අත්පිට විකුණුම් රු. 6 000
* 2013.01.10 රත්නාට ණයට විකුණුම් රු. 15 000
* 2013.01.15 රත්නා ආපසු එවුම් රු. 3 000
* 2013.01.25 කඩකුලී ගෙව්වා රු. 4 000

ජනවාරි මාසයට අදාළ පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

* 2013.01.31 දිනට තොගය රු. 12 000 කි.
* මාසය සඳහා මෝටර් රථ ක්ෂය රු. 2 000 කි.

[ දෙවැනි පිටුව බලන්න.

(vi) 2013.01.01 දිනට අමාලිගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය අගයයන් සමඟ ලියා දක්වන්න.

(vii) 2013 ජනවාරි මාසය සඳහා අමාලිගේ ව්‍යාපාරයේ මුදල් පොත පිළියෙල කරන්න.

(viii) මෙම ව්‍යාපාරයේ මුදල් පොත හැර පිළියෙල කළ යුතු වෙනත් මූලික පොත් **දෙකක්** නම් කරන්න.

(ix) මෙම ව්‍යාපාරයේ ජනවාරි මාසය සඳහා වූ මෝටර් රථ ක්ෂය ප්‍රමාණය ගිණුම්ගත කිරීමට අදාළ ජ'නල් සටහන ලියන්න.

(x) (අ) 2013.01.31 දිනට ජංගම නොවන වත්කම්වල ශුද්ධ අගය කොපමණ ද?

(ආ) 2013.01.31 දිනට ව්‍යාපාරයේ පවතින ජංගම වත්කම් **දෙකක්** වටිනාකම් සහිත ව ලියා දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ දැකිය හැකි ශක්තීන් **දෙකක්** හා දුර්වලතා **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) රමණී පාසල් ළමුන් සඳහා විශේෂිත හම් වර්ගයකින් මසනු ලබන පාසල් බෑග් නිෂ්පාදනය කර අලෙවි කිරීමට අදහස් කරයි. 2014 වර්ෂයේදී නිෂ්පාදනය කිරීමට බලාපොරොත්තු වන පාසල් බෑග් සංඛ්‍යාව 500 කි. එම පාසල් බෑග් නිෂ්පාදනය සඳහා දැරීමට සිදුවන මුළු පිරිවැය රු. 110 000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත. එක් පාසල් බෑගයක් රු. 300 කට අලෙවි කිරීමට රමණී අපේක්ෂා කරයි.

(අ) පාසල් බෑග් නිෂ්පාදනයට අදාළ ව දැරීමට සිදුවන සෘජු වියදමක් හා වක්‍ර වියදමක් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එක් පාසල් බෑගයක අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය කොපමණ ද? *(ලකුණු 02 යි)*

(ඇ) රමණීගේ ව්‍යාපාරයේ 2014 වර්ෂයේ ඇස්තමේන්තුගත විකුණුම් ආදායම කොපමණ ද? *(ලකුණු 02 යි)*

(ඊ) රමණී තම ව්‍යාපාරය 'රමණී ස්කූල් බෑග්ස්' නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරයි. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් ඇයට ලබා ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. *(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 10 යි)*

3. (i) (අ) වෙළඳපොළ පිටපත් කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) වාණිජ බැංකු විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන තැන්පතු වර්ග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක (ATM) දැකිය හැකි මූලික ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(iii) (අ) රෙදිපිළි මිලදී ගැනීම සහ විකිණීම සිදු කරන ව්‍යාපාරිකයෙකුට මුහුණ පෑමට සිදුවන අවදානම් **දෙකක්** සඳහන් කරන්න.

(ආ) එම එක් එක් අවදානම ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණ ඔප්පුව බැගින් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(iv) ඔබේ පාසලේ විදුහල්පතිතුමාට හදිසි ගුරු රැස්වීමක් අද දින පාසල නිම වීමෙන් පසු කැඳවීමට අවශ්‍ය ව ඇතැයි සිතන්න. මෙය පාසලේ සියලු ම ගුරු මහත්ම මහත්මීන්ට දැනුම් දීම සඳහා වඩාත් සුදුසු සන්නිවේදන ක්‍රමයක් යෝජනා කර, ඔබේ පිළිතුරට හේතු දක්වන්න. *(ලකුණු 02 යි)*

(v) ක්‍රමවත් ගබඩාකරණයක් පවත්වාගෙන යාම නිසා ව්‍යාපාරිකයෙකුට ලැබෙන හිතකර ප්‍රතිවිපාක **හතරක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 10 යි)*

4. (i) 'අද බොහෝ පුද්ගලයින් විවිධත් මාර්ගවල තම මුදල් ආයෝජනය කිරීමට පෙළඹී ඇත.'

(අ) එවැනි විවිධත් ආයෝජන මාර්ග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) පුද්ගලයන් විවිධත් ආයෝජන මාර්ගවල මුදල් ආයෝජනය සඳහා පෙළඹීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න සඳහන් කරන්න.

(අ) හවුල් ව්‍යාපාරයක අවම සාමාජික සංඛ්‍යාව දෙදෙනෙකු වන අතර, උපරිම සාමාජික සංඛ්‍යාව 20 කි.

(ආ) ආයෝජනයක අවදානම ඉහළ යන විට ඉන් ලැබෙන ප්‍රතිලාභය පහළ යයි.

(ඇ) සාමාන්‍ය කොටස් සඳහා නියමිත ලාභාංශයක් නොමැත.

(ඊ) ඉතිරි කිරීමේ තැන්පතු සඳහා, ස්ථාවර තැන්පතුවලට වඩා වැඩි පොලියක් හිමි වේ. *(ලකුණු 02 යි)*

(iii) ඔබ ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක්, සී/ස පෞද්ගලික සමාගමක් ලෙස ආරම්භ කිරීමට අදහස් කරන්නේ යැයි සිතන්න.

(අ) මෙම ව්‍යාපාරය සඳහා අවශ්‍ය වන ජංගම නොවන වත්කම් **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) එම ව්‍යාපාරයට මූල්‍ය සම්පාදනය කර ගත හැකි මූල්‍ය මාර්ග **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 10 යි)*

[ හත්වැනි පිටුව බලන්න.

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) 2013.01.01 දින ආරම්භ කරන ලද නිහාල්ගේ ව්‍යාපාරයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

(අ) නිහාල් රු. 100 000 ක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම.

(ආ) රු. 25 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම.

(ඉ) රු. 10 000 ක බඩු තොගයක් සුපුන්ගෙන් ණයට ගැනීම.

(ඊ) රු. 3 000 ක් කඩකුලිය මුදලින් ගෙවීම.

(උ) සුපුන්ට රු. 5 000 ක් ගෙවීම.

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු නිසා ගිණුම්කරණ සමීකරණයේ වත්කම්, වගකීම් හා හිමිකම්වලට වන බලපෑම අඩු වේ ද, වැඩි වේ ද, යන්න දක්වන්න. පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු දත්තය ඔබ වෙනුවෙන් සටහන් කර දක්වා ඇත.

| | වත්කම් | = | වගකීම් | + | අයිතිකරුගේ හිමිකම |
|---|---|---|---|---|---|
| (අ) | වැඩිවේ | = | | | වැඩිවේ |
| (ආ) | | | | | |
| (ඉ) | | | | | |
| (ඊ) | | | | | |
| (උ) | | | | | |

(ලකුණු 04 යි)

(ii) සපුමලීගේ ව්‍යාපාරයේ 2013.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම තුලනය නොවී ය. එහි වෙනස වූ රු. 300 අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදී. පසුව පහත සඳහන් වැරදි අනාවරණය විය.

A - රු. 4 500 ක ගැනුම් ඉන්වොයිසියක් පිළිබඳ ගිණුම් පොත්වල කිසිදු සටහනක් නොමැත.

B - ගෙවූ වේතන රු. 5 400 වේතන ගිණුමේ රු. 4 500 ක් ලෙස සටහන් කර ඇත.

C - මෝටර් රථ අලුත්වැඩියා වියදම වූ රු. 12 500 මෝටර් රථ ගිණුමට හර කර ඇත.

D - ලද ආයෝජන ආදායම් රු. 600 මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත වැරදි අතුරෙන් ශේෂ පිරික්සුමේ හර සහ බැර තීරුවල එකතුව අතර වෙනසක් ඇති කරන වැරදි ලියා දක්වන්න.

(ආ) එම වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් ලියන්න.

(ඉ) අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 06 යි)

(මුළු ලකුණු 10 යි)

6. (i) 2013.03.31 දිනට සාලියගේ ව්‍යාපාරයේ මුදල් පොතේ හර පැත්තේ බැංකු තීරුවේ ශේෂය රු. 15 500 ක් විය. 2013 මාර්තු මාසය සඳහා බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මුදල් පොතේ ශේෂය හා නොගැළපුණි. පසුව වෙනසට හේතු ලෙස පහත කරුණු අනාවරණය කර ගන්නා ලදී.

1. මාර්තු මාසය තුළ තැන්පත් කළ නමුත් එම මාසය තුළ දී නිෂ්කාශනය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 4 000 කි.
2. මුදල් පොතේ සටහන් නොවූ බැංකුව අයකළ ගාස්තු රු. 400 කි.
3. මාර්තු මාසය තුළ දී නිකුත් කළ නමුත් එම මාසය තුළ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 3 000 කි.
4. මුදල් පොතේ සටහන් නොවූ බැංකුවට සෘජුවම ලැබී ඇති ප්‍රේෂණ රු. 6 000 කි.

අවශ්‍ය වන්නේ,

(අ) 2013.03.31 දිනට මුදල් පොතේ බැංකු ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2013.03.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම.

(ලකුණු 0[illegible] යි)

(ii) අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපාරයක පුහුණු වන ගිණුම් ලිපිකරුවෙකු විසින් 2013.03.31 දිනට පිළියෙල කළ දෝෂ සහිත ශේෂ පිරික්සුමක් පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 70 000 |
| විකුණුම් | | 41 500 |
| ගැනුම් | 25 000 | |
| ආපසු යැවුම් | 1 800 | |
| ලී බඩු | 10 000 | |
| ගෙනඒමේ කුලී | 5 600 | |
| ගැතිලි | | 800 |
| ලද ගෙවල් කුලී | 1 000 | |
| යන්ත්‍ර | 50 000 | |
| ආයෝජන | | 2 000 |
| මුදල් ශේෂය | 20 900 | |
| | 114 300 | 114 300 |

අවශ්‍ය වන්නේ,

2013.03.31 දිනට නිවැරදි ශේෂ පිරික්සුම පිළියෙල කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 10 යි)

7. සමීරගේ ව්‍යාපාරයේ වෙළෙඳ ගිණුම පිළියෙල කිරීමෙන් පසු 2013.03.31 දිනට සකස් කළ ශේෂ පිරික්සුම පහත දක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| දළ ලාභය | | 60 000 |
| ප්‍රාග්ධනය- 2012.04.01 දිනට | | 80 000 |
| ප්‍රචාරණය | 10 000 | |
| ලිපිද්‍රව්‍ය වියදම් | 6 300 | |
| බැංකු ගාස්තු | 6 000 | |
| තොගය- 2013.03.31 දිනට | 32 500 | |
| ණය ගැතියෝ | 40 000 | |
| ණය හිමියෝ | | 20 000 |
| 15% බැංකු ණය | | 40 000 |
| ගොඩනැගිලි (පිරිවැයට) | 100 000 | |
| ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම 2012.04.01 දිනට | | 10 000 |
| වරිපනම් ගාස්තු | 3 000 | |
| විදුලි ගාස්තු | 8 500 | |
| රක්ෂණය | 6 000 | |
| දුන් වට්ටම් | 700 | |
| බැංකු ණය පොළී | 5 000 | |
| බැංකු අයිරාව | | 8 000 |
| | 218 000 | 218 000 |

අමතර තොරතුරු :

- ගොඩනැගිලි 10% බැගින් සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව ක්ෂය කළ යුතු ය.
- ණයගැතියන්ගෙන් රු. 1 500 ක් බොල්ණය ලෙස කපා හැරිය යුතු ය.
- 2013.03.31 දිනට ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු රු. 1 000 කි.

අවශ්‍ය වන්නේ,

(i) 2013.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමීරගේ ව්‍යාපාරයේ ලාභාලාභ ගිණුම. (ලකුණු 05 යි)

(ii) 2013.03.31 දිනට ශේෂ පත්‍රය. (ලකුණු 05 යි)

(මුළු ලකුණු 10 යි)

* * *